# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

## සීමාසහිත මහනුවර ශ්‍රී පුෂ්පදාන සමිතිය
## (සංස්ථාගත කිරීමේ)

**සීමාසහිත මහනුවර ශ්‍රී පුෂ්පදාන සමිතිය සංස්ථාගත කිරීම**
**සඳහා වූ පනත් කෙටුම්පතකි**

මහනුවර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු දිළුම් අමුණුගම මහතා විසින්
2015 නොවැම්බර් මස 24 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2015 නොවැම්බර් මස 09 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

[23 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ : රු. 8.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 10.00 යි.**

2—PL 009428—225 (2015/11)

## සීමාසහිත මහනුවර ශ්‍රී පුෂ්පදාන සමිතිය (සංස්ථාගත කිරීමේ)

එල්.ඩී.—ඕ. 6/2006.

## සීමාසහිත මහනුවර ශ්‍රී පුෂ්පදාන සමිතිය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

පූර්විකාව.

"සීමාසහිත මහනුවර ශ්‍රී පුෂ්පදාන සමිතිය" යනුවෙන් හඳුන්වනු ලබන සමිතියක් එකී සමිතියේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව එකී සමිතිය සම්බන්ධ සියලු පරමාර්ථ හා කාරණා ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමේ සහ කර ගෙන යාමේ කාර්යයන් සඳහා මෙතෙක් කල් පිහිටුවා තිබූ හෙයින් ද:

එකී සමිතිය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කාරණා සඳහා ද ඒ පරමාර්ථ හා කාරණා මෙතෙක් කල් එකී සමිතිය විසින් සාර්ථකව ක්‍රියාත්මක කර හා ඉටු කර ගෙන ගොස් ඇති හෙයින් සහ එම සමිතිය සංස්ථාගත කරනු ලැබීමට ඉල්ලුම් කර ඇති හෙයින් ද එකී ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

1. මේ පනත 2015 අංක    දරන සීමාසහිත මහනුවර ශ්‍රී පුෂ්පදාන සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

සීමාසහිත මහනුවර ශ්‍රී පුෂ්පදාන සමිතිය සංස්ථාගත කිරීම.

2. මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට හා ඉන් පසුව (මෙහි මින් මතු "සමිතිය" යනුවෙන් සඳහන් කරනු ලබන) සීමාසහිත මහනුවර ශ්‍රී පුෂ්පදාන සමිතියේ දැනට සාමාජිකයන්ව සිටින තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සමිතියට මින් මතු සාමාජිකයන් වශයෙන් බඳවා ගනු ලබන තැනැත්තන් (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "සීමාසහිත මහනුවර ශ්‍රී පුෂ්පදාන සමිතිය" යන නාමය හා අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, සංස්ථාව විසින් හා එයට විරුද්ධව ද, එකී නාමයෙන් සියලු අධිකරණවල නඩු පැවරීමට හා නඩු පවරනු ලැබීමට ද, තව ද පොදු මුද්‍රාවක් තබා ගැනීමේ හා පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය හා අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය.

2—PL 009312—300 (2015/10)

සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද ඒ පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) ශ්‍රී දළදා මාළිගාව වැඳ පුදා ගැනීමට පැමිණෙන බැතිමතුන්ට, පසළොස්වක, අමාවක පෝය දිනවල විශේෂයෙනුත් සෙසු දිනවල සාමාන්‍ය වශයෙනුත් පූජා කිරීම පිණිස නොමිලයේ මල් දීම හා පසළොස්වක පොහෝ දිනවලට දළදා සමිඳුන්ට කිරි ආහාර පිදීම;

(ආ) ගිහි පැවිදි වන්දනාකරුවන්ට සමිති ශාලාවේ නවාතැන් පහසුකම් සලසා දීම;

(ඇ) බෞද්ධ ජනතාවගේ ඥානාලෝකය වර්ධනය කිරීම පිණිස පාසල් හා දහම් පාසල් ප්‍රතිෂ්ඨාපනය කර ගෙන පවත්වා ගෙන යාම;

(ඈ) ඉරු දින දහම් පාසල් සේවයට අමතරව අන්තර් දහම් පාසල් කථික තරග, විවාද තරග, දැනුම මිනුම තරග, අධ්‍යාපන චාරිකා හා වැඩමුළු සංවිධානය කිරීම;

(ඉ) බෞද්ධ ප්‍රතිපත්තිවල හා බෞද්ධ සංස්කෘතියෙහි ප්‍රගතිය උදෙසා අවශ්‍ය සෑම පියවරක් ම ගෙන කටයුතු කිරීම;

(ඊ) බෞද්ධ ජනතාවගේ ආගමික හා ජාතික අනන්‍යතාව සුරැකෙන පරිදි සංස්ථාව නිරතුරු ක්‍රියාකාරී වන අතර, සෙසු ආගමිකයන්ගේ හා ජාතීන්ගේ අයිතිවාසිකම්වලට ගරු කිරීම;

(උ) බෞද්ධ ජනතාවගේ ආර්ථික වර්ධනයට අදාළ පිළියම් යෙදීම හා සාමාජිකයන් අතර අන්‍යොන්‍ය සුහදතාව තහවුරු කිරීමට පියවර ගැනීම;

(ඌ) ගිහි පැවිදි දෙපක්ෂයේ ම දේශීය හා විදේශීය ධර්ම දූතයන් පුහුණු කිරීම;

(එ) රැකියා විරහිත තරුණ - තරුණියන් වෙනුවෙන් වෘත්තීය පාඨමාලා පැවැත්වීම හා ඔවුන් රැකියාවලට යොමු කිරීම;

(ඒ) විභාගවලට සූදානම් වන සිසු - සිසුවියන් උදෙසා උපකාරක පන්ති පැවැත්වීම;

(ඣ) දේශීය, සංස්කෘතික හා ආගමික විශේෂාංග ඔප් නැංවෙන පරිදි වර්ෂයක් පාසා අලි ඇතුන් සහිතව සංවිධානය කරනු ලබන මිහිඳු පෙරහැර සෑම පොසොන් පොහෝ දිනක ම මහනුවර වීදි සංචාරය කිරීම;

(ඤ) ස්වාභාවික හා ජාතික විපත් පැමිණි අවස්ථාවල දී විපතට පත් වූවන්ට සහ අවතැන් වූවන්ට සුදුසු පරිදි මූල්‍යමය, ද්‍රව්‍යමය හා වෙනත් ආධාර සැපයීම; සහ

(ඥ) ආගමික හා දේශීය සංස්කෘතියේ පැවැත්මට ඉවහල් වන සේ ක්‍රියාකාරී වන ඕනෑ ම බහුජන සංවිධානයන් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

4. (1) මෙම සංස්ථාව ගිහි - පැවිදි පස් දෙනකුට නොවැඩි අනුශාසක මණ්ඩලයකින් ද, ප්‍රධාන සභාපති, උප සභාපතිවරුන් තුන් දෙනකුගෙන් ද, ප්‍රධාන ලේකම් හා භාණ්ඩාගාරිකගෙන් සමන්විත භාරකාර මණ්ඩලයකින් ද, ප්‍රධාන සභාපති, උප සභාපතිවරුන් තුන්දෙනකුගෙන් ද, ප්‍රධාන ලේකම්, උප ලේකම්, භාණ්ඩාගාරික, පරීක්ෂක, සාමාන්‍යාධිකාරී සහ ආගමික අංශයේ ලේකම් යනුවෙන් දස දෙනකුගෙන් යුත් නිලධාරී මණ්ඩලයකින් ද, නිලධාරී මණ්ඩලයට අමතරව පහළොස් දෙනකුගෙන් යුත් මහ කාරක සභාවකින් ද, මහ සභාවෙන් ද සමන්විත ය.

මීට අතිරේකව මහ කාරක සභාවේ අභිමතය පරිදි තෝරා පත් කර ගනු ලබන කාරක සභා හතරක් මුදල් සහ ගොඩනැගිලි, ආගමික හා සංස්කෘතික, අධ්‍යාපන, සමාජ සේවා හා විශේෂ ව්‍යාපෘති යනුවෙන් වන අතර, ඒ ඒ ව්‍යාපෘති දියත් කිරීමේ දී ඇති වන අවශ්‍යතාවන් අනුව විශේෂ ව්‍යාපෘති අනුකාරක සභා පත් කෙරේ.

(2) සංස්ථාවේ නිලධාරින්ගෙන් හා සංස්ථාවේ නීති රීතිවලින් විධිවිධාන සලස්වා ඇති පරිදි සහ එකී රීතිවලට අනුකූලව තෝරා පත් කර ගනු ලබන හෝ නම් කරනු ලබන වෙනත් තැනැත්තන්ගෙන් සමන්විත වූ මෙහි මින් මතු "සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන කළමනාකරණ සභාවක් විසින් තත්කාලයේ බලපවත්නා සංස්ථාවේ රීතිවලට යටත්ව සංස්ථාවේ පරිපාලන කටයුතු මෙහෙය විය යුතු ය.

(3) සංස්ථාවේ ප්‍රථම කළමනාකරණ සභාව මේ පනත ක්‍රියාත්මක කිරීම ආරම්භ වන දිනට පෙරාතුව වූ දිනයේ දී තනතුරු දැරූ සමිතියේ කළමනාකරණ සභාව විය යුතු ය.

භාරකාර මණ්ඩලය.

**5.** (1) සමිතියේ සියලු ම නිශ්චල හා චංචල දේපළවල භාරකාරත්වය, සංස්ථාවේ රීතිවලට අනුකූලව තෝරා පත් කර ගනු ලබන සාමාජිකයන් සංඛ්‍යාවකින් සැදුම් ලත් භාරකාර මණ්ඩලයක් වෙත එකී රීතිවලට යටත්ව පැවරිය යුතු ය.

(2) සංස්ථාවේ ප්‍රථම භාරකාර මණ්ඩලය මෙම පනත ක්‍රියාත්මක කිරීම ආරම්භ වන දිනට පෙරාතුව වූ දිනයේ දී නිල දැරූ සමිතියේ භාරකාර මණ්ඩලය ම විය යුතු ය.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

**6.** මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව පහත දැක්වෙන බලතල සංස්ථාවට ඇත්තේ ය:—

(අ) යම් මිලයට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, අන්තිම කැමති පත්‍රයකින් දේපල බැහැර කිරීමක් ප්‍රකාර හෝ අන්‍යාකාරයකින් සංස්ථාව සතු චංචල හෝ නිශ්චල යම් දේපලක් අත්කර ගැනීම, දැරීම සහ සංවර්ධනය කිරීම;

(ආ) එවැනි යම් දේපළක් විකිණීම, උකස් කිරීම, බදු දීම, හුවමාරු කිරීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම;

(ඇ) සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කර ගෙන යාමේ කාර්යය සඳහා අවශ්‍ය වන නිලධාරීන් සහ සේවකයන් පත් කිරීම, සේවයෙහි යෙදවීම, ඔවුන්ට පාරිශ්‍රමික ගෙවීම, ඔවුන් විෂයයෙහි විනය පාලනය ක්‍රියාත්මක කිරීම සහ ඔවුන් සේවයෙන් පහ කිරීම;

(ඈ) දේශීය හෝ විදේශීය ප්‍රභවයන්ගෙන් ලැබෙන මුල්‍යමය හා ද්‍රව්‍යමය ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග භාර ගැනීම;

(ඉ) බැංකු ගිණුම් විවෘත කිරීම, පවත්වා ගෙන යාම සහ වසා දැමීම සහ ඇප ඇතිව හෝ ඇප නොමැතිව මුදල් ණයට ගැනීම හෝ ලබා ගැනීම;

(ඊ) සංස්ථාවේ මුදල් සංස්ථාව විසින් තීරණය කරනු ලබන යම් යම් සුරැකුම් පත්වල ආයෝජනය කිරීම; සහ

(උ) සංස්ථාවේ පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා ආනුෂංගික හෝ හිතකර වෙනත් සියලු ක්‍රියා හා දේ කිරීම.

7. (1) සංස්ථාවේ අරමුදල පහත සඳහන් මුදල්වලින් සමන්විත විය යුතු ය:— සංස්ථාවේ අරමුදල.

(අ) මේ පනත ආරම්භ වන දිනයට ඉහතින් වූ දිනයෙහි දී සමිතියේ බැරට පැවැතියා වූ ද, එදින සිට සංස්ථාවට පවරනු ලැබිය යුතු වූ මුදල් ; හා

(ආ) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වූ දිනයෙන් පසුව සංස්ථාවට ලැබෙන මුදල්.

(2) සංස්ථාවේ බැරට ඇති සියලු ම අරමුදල් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සඳහා සහ එහි පරමාර්ථ මුදුන්පත් කර ගැනීම සඳහා යොදවනු ලැබිය යුතු ය.

8. (1) සංස්ථාව විසින් සංස්ථාවේ යම් මහ සභා රැස්වීමකට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් පහත දැක්වෙන කාරණා සියල්ල ම හෝ ඉන් කිසිවක් සඳහා මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති කලින් කල සෑදීම නීත්‍යානුකූල වන්නේ ය :— සංස්ථාවේ රීති.

(අ) සංස්ථාවේ සාමාජිකයන් තෝරා පත් කර ගැනීම හෝ නම් කිරීම සහ ඔවුන්ගේ බලතල, කාර්ය සහ ඔවුන්ගේ ධුර කාලය;

(ආ) සංස්ථාවේ විවිධ නිලධරයන්, නියෝජිතයන් සහ සේවකයන්ගේ බලතල, චර්යාව, කාර්ය සහ කර්තව්‍ය;

(ඇ) සංස්ථාවේ රැස්වීම් කැඳවීමේ දී සහ පැවැත්වීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය, රැස්වීම් පවත්වන වේලාවන්, ස්ථාන සහ රැස්වීම් පිළිබඳ න්‍යාය පත්‍රය සහ රැස්වීම්වල ගණපූරණය සහ ඒ රැස්වීම්වල කටයුතු සහ ඊට ආනුෂංගික කටයුතු පවත්වාගෙන යාම;

(ඈ) සභාවේ සහ සංස්ථාවේ සාමාජිකත්වය සඳහා සුදුසුකම් සහ නුසුදුසුකම්;

(ඉ) සංස්ථාවේ දේපල පරිහරණය කිරීම, සංස්ථාවේ මුදල්වල භාරකාරත්වය සහ සංස්ථාවේ ගිණුම් පවත්වා ගෙන යාම හා විගණනය කිරීම; සහ

(ඊ) සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම හා එහි පරමාර්ථ මුදුන්පත් කර ගැනීම.

(2) 1 වන උපවගන්තිය යටතේ සාදනු ලැබූ කවර වුව ද රීතියක් එවැනි ම රැස්වීමක දී එවැනි ම ආකාරයෙන් සංශෝධනය කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ එය පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට ඉහතින් වූ දිනයේ දී පැවැති සමිතියේ රීති මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවනතාක් දුරට මේ වගන්තිය යටතේ සෑදූ සංස්ථාවේ රීති ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) සංස්ථාවේ සියලු ම සාමාජිකයෝ සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට යටත් විය යුත්තාහ.

*සංස්ථාවට ගෙවිය යුතු සහ සංස්ථාවට අය විය යුතු ණය.*

**9.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට ඉහතින් ම වූ දිනයේ දී පැවැති සමිතියේ සියලු ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවා නිදහස් කළ යුතු අතර, ඒ දිනයේ දී සමිතියේ අය විය යුතු හෝ ගෙවිය යුතු සියලු ම ණය, දායක මුදල් ඇතුළු විවිධ පුණ්‍යාධාර මුදල් මේ පනතේ කාර්යයන් සඳහා සංස්ථාවට ගෙවිය යුතු ය.

*සංස්ථාවේ මුද්‍රාව.*

**10.** සංස්ථාවේ මුද්‍රාව සංස්ථාවේ ලේකම්වරයාගේ භාරයේ තිබිය යුතු අතර, ලේකම්වරයා සහ සංස්ථාවේ රීතිවලින් විධි විධාන සලස්වා ඇති පරිදි වූ වෙනත් යම් තැනැත්තන් සංඛ්‍යාවක් ඉදිරිපිට දී හැර සංස්ථාවේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට නොතැබිය යුතු ය. ඔවුන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඔවුන් විසින් එකී සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු අතර, ඒ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට පරිබාහිරව විය යුතු ය.

*ජනරජයේ සහ අන්‍යන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.*

**11.** මේ පනතේ සඳහන් තැනැත්තන්ගේ සහ ඔවුන් මගින්, ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන වෙනත් තැනැත්තන්ගේ අයිතිවාසිකම්වලට හැර ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙන තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේ ය.

*අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.*

**12.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.